# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# උපකුලපති තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 වන වගන්තියේ සහ එහි තදනන්තර සංශෝධන නියමයන් ද අංක 03/2023 **කොමිෂන් සභා චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර ව ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලක සභාව උපකුලපති තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.**

අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු අතර, අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු හැට තුනට (63)ට අඩු විය යුතුයි. උපකුලපතිවරයා ධූර කාලය අවසන්වීමට පෙර තනතුරින් ඉවත් කළහොත් හෝ සේවය අත්හැරියහොත් හැර විශ්වවිද්‍යාල පනතට අනුව වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලබන අතර, ඔහු/ඇය වයස අවුරුදු 65 සම්පූර්ණ වනතුරු හෝ උපකුලපති තනතුරේ කාලය අවසන් වනතුරු හෝ යන දෙකෙන් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කළයුතු වේ.

විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව උපකුලපතිවරයා පූර්ණ කාලීන නිලධාරියෙක් වන අතර, ප්‍රධාන විධායක නිලධාරියා, ප්‍රධාන අධ්‍යයන නිලධාරියා හා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ද වේ. ඔහු/ඇය නිල බලයෙන් පාලක සභාවේ හා සනාතන සභාවේ සාමාජිකයෙක් හා සභාපතිවරයා ද වේ.

උපකුලපතිවරයා අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම, පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම සහ විශ්වවිද්‍යාලයීය පරිපාලනය සම්බන්ධයෙන් වගකිව යුතු වේ. ඔහු/ඇය විශ්වවිද්‍යාල අධ්‍යයන විශිෂ්ටත්වය, පාරදෘශ්‍යභාවය, වගකීම, ප්‍රජාතාන්ත්‍රික කළමනාකරණය හා සඵල අපක්ෂපාතී නායකත්ව මූලධර්ම උත්ථම්භනය කළ යුතු වේ.

උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ඉහළම වැටුප් තලයේ තැබීමට හිමිකම් ලබන අතර, තනතුරට අදාළ අනෙකුත් දීමනා හා පහසුකම් ලැබීමට හිමිකම් ලබයි.

අයදුම්කරු ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය සමග විශ්වවිද්‍යාලයේ අභිවෘද්ධිය සඳහා ස්වකීය දැක්ම පිළිබඳව ප්‍රකාශයක්, උපකුලපති ධූරයට පත් කරනු ලැබුවහොත් ඔහු/ඇය සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත යෝජනා පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් සහ උපන් දිනය ද ඇතුළත්ව සකස් කළ සම්පූර්ණ ජීව දත්ත පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. ඊට අමතරව, ඉහත ලිපි ලේඛන හා සහාය ලේඛනවල මෘදු පිටපතක් PDF ආකෘතියෙන් application2023@sjp.ac.lk විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කළ යුතු වේ.

අයදුම්කරු වත්මන් උපකුලපතිවරයා හෝ මෙම විශ්වවිද්‍යාලයේ පෙර උපකුලපති තනතුර දැරුවෙකු නම් ඔහුගේ/ඇයගේ පළමු ධූර කාලය තුළ සාක්ෂාත් කරගත් සාර්ථකත්වය උද්දීපනය කරමින් වාර්තාවක් ඉහත සඳහන් ලේඛනවලට අමතරව ඉදිරිපත් කළ යුතුය. මෙම වාර්තාවේ මෘදු පිටපතක් ද PDF ආකෘතියෙන් application2023@sjp.ac.lk විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කළ යුතුවේ.

අයදුම්කරු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හැර රාජ්‍ය සේවයේ, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවය කරන්නෙකු නම්, ඔහු/ඇය මෙම තනතුරට පත් කරනු ලැබුව හොත් සේවයෙන් නිදහස් කළ හැකිද යන්න දක්වමින් අයදුම්කරු විසින් තම සේවා යෝජකගේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

අයදුම්කරුවන් විශේෂ පාලක සභාවක් හමුවේ විනාඩි 10කට නොඅඩු හා විනාඩි 15කට නොවැඩි සංක්ෂිප්ත ඉදිරිපත් කිරීමක් සඳහා කැඳවනු ලැබේ.

පාලක සභාවේ සභාපතිවරයාට හෝ අනෙකුත් සාමාජිකයෙකුට ඕනෑම අයදුම්කරුවෙකුගෙන් ඔහුගේ/ඇයගේ ස්වකීය දැක්ම පිළිබඳව, ජීව දත්ත විස්තරය පිළිබඳව සහ ඉදිරිපත් කිරීම පිළිබඳව උපකුලපති තනතුර සඳහා ඔහුගේ/ඇයගේ යෝග්‍යත්වය තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු ලබා ගැනීමට ප්‍රශ්න කිරීමට අයිතියක් ඇත.

රෝහල් ගතවීමක් හෝ විදේශගත වීමක් හේතුවෙන් යම් අයදුම්කරුවෙකුට විශේෂ පාලක සභාව හමුවේ භෞතිකව පෙනී සිටීමට නොහැකි නම් ලේඛකාධිකාරීවරයාගේ පූර්ව දැනුම්දීමකින් අනතුරුව ඔහුට/ඇයට දුරස්ථ ප්‍රවේශ ක්‍රමයක් මගින් පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2023 හි සඳහන් මතු සඳහන් නිර්ණායක හත පදනම් කර ගෙන අයදුම්කරුවන් ඇගයීමකට ලක් කරනු ඇත.

i. **උපාය මාර්ගික අවධානය**
ii. **ඵලදායී නායකත්වය**
iii. **සමස්ත චින්තනය/ සංකල්පමය කුසලතා**
iv. **ශාස්ත්‍රීය හා පර්යේෂණ විශිෂ්ටත්වය**
v. **පුද්ගලික අඛණ්ඩතාව**
vi. **වෘත්තීය සන්නිවේදනය**
vii. **කළමනාකරණ නිපුණතාව**

උපකුලපති තනතුර සඳහා තෝරා ගැනීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2023.04.10 දිනැතිව නිකුත් කරන ලද අංක 03/2023 චක්‍ර ලේඛය ප්‍රකාරව සිදු කරනු ලබන අතර, එය http://www.sjp.ac.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක.

අයදුම්පත්‍ර 2023 මැයි 29 දින ප.ව. 3.00 ට හෝ ඊට ප්‍රථම “ලේඛකාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ” ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කිරීම හෝ පැමිණ භාර දීම සිදු කළ යුතු වේ.

අයදුම්පත්‍ර ඉදිරිපත් කරන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "**උපකුලපති තනතුර** " ලෙස සඳහන් ,කළ යුතු වේ.

ඉහත සඳහන් නියමිත දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත්‍ර සලකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරී හා පාලක සභාවේ ලේකම්,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.**
**2023.04.20**